DOI: 10.31357/fhssmst.2013.00026

# ''නූතන ශ්‍රී ලාංකික ජන සමාජයෙහි සාරධර්ම පෝෂණය විෂයයෙහි දහම් පාසල් අධ්‍යාපනයේ බලපෑම''

(බුත්තල ශාසනාරක්ෂක බලප්‍රදේශය ඇසුරිනි)

මහප්පු කෝරාළලාගේ පද්මාලි චම්පා ගුණරත්න

16 JAN 2013

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

## කර්තෘ ප්‍රකාශය

මේ නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේගේ සහ මහාචාර්ය ආරියපාල පෙරේරා ඇදුරුතුමන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කළ බවත් මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් වෙනත් විශ්වවිද්‍යාලයකට, ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි.

[signature] ................................ 2010 . 06 . 07 .

අපේක්ෂකයාගේ අත්සන | දිනය

## උපදේශකවරුන්ගේ නිර්දේශය

මේ අපේක්ෂිකාව විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත් මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

1. ................................................ දිනය :- 2010.06.07

ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි

උපදේශක

2. ................................................ දිනය :- 07.06.2010

මහාචාර්ය ආරියපාල පෙරේරා

උපදේශක

## සංශෝධිත නිර්දේශය

2012.11.30 දින පැවැත්වූ වාචික පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමු.

1. ................................................ දිනය :- 15.01.2013

ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි

උපදේශක

2. ................................................ දිනය :- 15.01.2013

මහාචාර්ය ආරියපාල පෙරේරා

උපදේශක

# පිදුම

උගන්වා දරුවෙකුට
සැනහෙනා පියෙකු මෙන්
උසස් අධ්‍යාපනය
මට දුන්න පියා ඔබ ...

මවු සෙනහසේ අඩුව
බිඳක්වත් නො දැනෙන්න
මා නොමැති විට මව ද
ඔබම විය දරුවන්ට ....

නේක දුක් කම් කටොළු
දරා ගෙන නො පෙන්වා
හෙළා ඩා බිඳු ඉසුරු
අවැසි දේ පිරිමසා
සිවු දරුවනගෙ බරම
බරක් නොම සේ දරා
තව ඉගෙන ගන්න මට
වරම් දුන් දෙවිඳු ඔබ ...

උවම් නැත පහදන්න
වදන් නැත අගයන්න
මේ සෑම අකුරකම
දිරිය ශක්තිය ඔබය
දිවිමගේ හැම තැනම
සවිය අත්වැල නිබඳ
මගේ 'සඳු' හිමියනේ.
පොත පුදමි පා නැමද ...

## පුදම් තුති කුසුම් ...

මගේ ගුරු දෙවිඳුනේ - දිරිය දී මා සුරැකි

ඔබ නො වන්නට අසල - යා නොහැක මට ඉහළ ...

ජීවිතේ මා දුටුව - එකම බෝසත් සිරිත

ගුරු බැතින් පා වඳිමි - පසඟ පිහිටුවා මිහි''

දුරු දේශයක හිඳ පැමිණ වෙහෙසෙනා විට මගේ පෞද්ගලික අපහසුතා වටහා ගෙන නිරතුරුම උදව් කළ හා රෑ දහවල් වෙහෙස නො බලා නිබන්ධයේ අඩුපාඩු පෙන්වා දී මෙය සාර්ථක ව නිමාලන්නට අවැසි උපදෙස් දෙමින් පොත පත සපයා දෙමින්, නේක බාධකමැද ගත් උත්සාහයේ ප්‍රතිඵලය රැක ගන්නට තිබඳ මට ශක්තියක් වූ දයාබර ආරියපාල පෙරේරා ගුරු පියාණන්ටත්, නෙක අවශ්‍යතා ඉටුකර දෙමින් මට උදව් දුන් එම මැතිණියටත් ගරු පෙරදැරිව තුති කුසුම්...

නිවැරදි උපදේශනය දෙන්නට හැම විට ම කැප වී, දහසක් බාධක මැද සිටි මාව තේරුම් ගනිමින් නිබන්ධයේ අඩුපාඩු සකසා දී උත්සාහයේ ප්‍රතිඵලය රැක ගන්නට දිරිය දුන් ගෞරවනීය අපේ ලොකු හාමුදුරුවෝ මාගම්මන පඤ්ඤානන්ද හිමිපානන්ට ගරු පෙරදැරිව තුති කුසුමක්...

කාලීන සමාජ අවශ්‍යතාවක අගය වටහා දෙමින් දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණය කරන්නැයි මාව යොමු කොට මාතෘකාව විධිමත් ව සකස් කර දී මාව දිරිමත් කරමින් පොත පත සොයා දෙමින් අවැසි හැම විට උදව් දුන් දයාබර කේ.ඒ. වීරසේන ගුරු පියාණන්ට ගරු පෙරදැරිව තුති කුසුමක්...

රාජකාරී අවශ්‍යතා සපුරාදීමෙන් නොනැවතී මේ කාර්යය කරන්නට පෞද්ගලිකව ද මාව දිරිමත් කළ, අවැසි හැම විට උදව් දුන් දයාබර මහේෂ් මහත්තයාට, හද දයාබරිතව තුති කුසුමක්...

පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපති තුමා, අනුලා මිස්, අනුර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත්, පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ, ධම්මදස්සී හිමි, ඥානදාස සර් ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාට ත්, පොත පත සපයා දී මට උදව් කළ සාරානන්ද හිමිට හා ගාමිණී ගුරුතුමාට ත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් තුති කුසුම්...

'හිමියනේ, ඔබේ මේ කැප කිරීම් නො වන්නට මා ලියන පොතක් නැත'. දරුවන්ගේ බර මට නොදී මේ කාර්යය කරන්නට නිබඳ දිරිය, සවිය නිදහස දී පර්යේෂණ අවශ්‍යතා සඳහා යා යුතු හැම තැනක මා එක්ක ගිය 'මගේ සඳු අප්පච්චී' ප්‍රියන්තට හද බැතින් තුති කුසුමක්...

දරුවන් බලා ගනිමින් මට සහය දුන් සදාදරණීයය මගේ අම්මාට, හිමිගෙ අම්මාට තාත්තාට, හීං මාමාට, අපේ අක්කා චින්තාට, අයියාට, ඉසුරු, ධනුෂා, දුමිඳු දරුවන්ට තුති කුසුම්...

නිතර මවු සෙනෙහස සෙවූ මුත්, ඒ අඩුව දරාගෙන, මට වදයක් නොවූ, බුද්ධි, පෙමිඳු, යසිඳු, දසිති මගේ රත්තරං දරුවන්ට තුති කුසුම්...

මෙය ලියන්නට නිදහස් තැනක් සෙවූ මා හට ඊට ඉඩ හසර දී අවැසි උපකාර කළ දයාබර ජයසේන ගුරුතුමාටත් එම මැතිණියටත් දුවටත් පුතාටත් හද බැතින් තුති කුසුම්...

අවැසි පොත පත හා කරුණු, වෙහෙස වී සොයා දෙමින් පුස්තකාලයේ සෙවන මට දී, මහත් අස්වැසිල්ලක් සැපයූ පාසලේ පුස්තකාලයාධිපති කමලා ගුරුතුමියට හා නිවාඩු දී නිදහස් කළ නව විදුහල්පති සෙනවිරත්න මහතාටත් නෙක උදව් කළ රෝහිත පුෂ්පකුමාර ගුරුතුමාටත්, ධීරසිංහ ගුරුතුමා ඇතුළු ගුරු මණ්ඩලයේ සියලු ම දෙනාටත් තුති කුසුම්...

හැම විට ම උපදෙස් දෙමින්, උදව් කරමින් මාව දිරිමත් කරන, නිබඳ සවිය අත්වැල වූ මගේ දයාබර ලතා රංජනී (රංජී) සොයුරියට හා චන්න අයියාට තුති කුසුම්...

කොළඹ ආ විට මට නවාතැන් දෙන, උදව් කරන දයාබර ගංගා අක්කාට, උපුල් අයියාට, පසීට, පූර්ණිට තුති කුසුම්...

පරිගණකයක් මට රැගෙන දුන් ශ්‍යාමේන්, රොහාන් දෙපටලත්, පරිගණක යතුරු ලියනයෙන් සහය දුන් දයාබරයන් වන රෝහිත මල්ලීට, අංජලී නංගීට, කෙසෙල්වත්ත අක්කාට, චාන්දනී නංගීට, සුමිත් මල්ලීට, දිමුතු දුවට, බුද්ධි පුතුට, සුමුදු කුමුදු දුවලාට හා වැඩි බරක් දැරූ දයාබර සාමා පුෂ්ප කුමාරි නංගීට තුති කුසුම්...

තොරතුරු ලබා ගන්නට සහය දුන් බුත්තල පොලීසියේ පොලිස් පරීක්ෂක බන්දුල ධනපාල මහතා ඇතුළු නිලධාරී මඬුල්ලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක ස්වාමීන්වහන්සේ හා ගුණා මිස්, කෙසෙල්වත්ත මිස්, ඇතුළු කාර්ය මණ්ඩලයට. දහම් පාසල්වල ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේලාට, දුටුගැමුණු පාසලේ ගුරුවරුන්ට හා දරු දැරියන්ට, දත්ත විශ්ලේෂණය සඳහා සහය දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ අනුෂා ප්‍රියදර්ශනී දුවට, ඉෂාන් රම්මික පුතාට තුති කුසුම්...

මේ කාර්යයේ දී පුංචි හෝ උදව්වක් කළ සැම හට ම තුති කුසුම්.

# හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ සිදු වූ සමාජ විපර්යාසය ඉතා විශාලය. බුදු දහමත් සම්බුද්ධ ශාසනයත් ජන ජීවිතය හා තදින් ම බැඳුණි. දේශයට ආවේනික ජාතියට ආවේනික ආගමක් ලෙස දැනෙන තරමට රට දැය සමය ඒකාත්මික විය. ස්වාධීනත්වය, පරෝපකාරය, අන්මත ඉවසීම, අභියෝග හමුවේ නොසැලී සිටීම වැනි ගුණාංග හෙළ ජන හදවත් තුළ රෝපණය වූ අතර ඒවා පරපුරෙන් පරපුරට දායාද විය. පැවති අන්ධ විශ්වාසයන්ගෙන් ඈත්කොට පටු ආකල්පවලින් මුදවා ජන විඥානය අවදි කිරීම මුළු ලක්දිව පුරාවට සිදුවිය.

බුදුදහම අප රටට මැනවින් දායාද කිරීම සම්බන්ධයෙන් මිහිඳු මාහිමියන්ගේ කාර්යභාරය ඉතා වැදගත් විය. පළමු ව දහම් අවබෝධය ලබන්නේ රජු ය. අඹ හා ඥාති පැනයෙන් රජුගේ බුද්ධිය විමසා දහම් අවබෝධය සලසයි. එබැවින් ලක්දිව පළමු දහම් අධ්‍යාපනික පියවර ලෙස ඒ අවස්ථාව දැක්විය හැකිය. මිහිඳු හිමි ඇතුළු පිරිස දහම් අධ්‍යාපනය ලාංකිකයන්ට ලබා දීමේ කාර්යය මැනවින් ඉටු කළ නිසා ලක්දිව පුරාම බුදුදහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය.

බුදු දහම සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාව ක්‍රියාත්මක වන්නේ බෞද්ධ විහාරස්ථාන ඇසුරෙනි. අනුරාධපුර මහමෙවුනා උයනෙහි මිහිඳු මහරහතන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ආරම්භ කරන ලද මහා විහාරය ලක්දිව ප්‍රථම විහාරස්ථානය මෙන්ම ප්‍රථම අධ්‍යාපන විද්‍යාස්ථානය ද විය. සෑම ගමකම පාහේ පන්සලක් බිහි වූ අතර එය ගමේ අධ්‍යාපන මධ්‍යස්ථානය ද විය. ධර්ම විනය පමණක් නොව සියලු ශිල්ප ශ්‍රේණීන්ට අදාළ සකලවිධ අධ්‍යාපනය මේවායෙහි දී ලබා දෙන ලදී. ඇතැම් අධ්‍යාපන මධ්‍යස්ථාන උසස් අධ්‍යාපන ආයතන බවට ද පත් විය.

ජන ජීවිතයේ සෑම අංශයක් කෙරෙහි ම බුදුදහම තදින් කාවැදුනෙන් දහසය වැනි සියවසේ සිට සියවස් ගණනාවක් තිස්සේ කතෝලික ආගම මෙරට ප්‍රචාරය කිරීමට සහ ජන

ජීවිතයේ කොටසක් කිරීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක විය. මෙරටට සිදු වූ විදේශික-විජාතික බලපෑම් කෙතරම් ප්‍රබල වුව ද බුද්ධාගම මුලිනුපුටා දමන්නට කිසිදු බලවේගයකට නොහැකි විය. බුදු සසුනත් ජන දිවියත් එකට බැඳීම හා ජන ජීවිතයට බුදුදහම ප්‍රබල ව කාවැද තිබීමත් බුදු දහම රට පුරා හැම ජන හදවතකටම සන්නිවේදනය වී තිබීමත් ඊට හේතු විය.

විදේශ ආධිපත්‍යය නිසා අභාග්‍ය සම්පන්න තත්ත්වයකට පත්වන්නට ලාංකික බෞද්ධයන්ටත් භික්ෂූන්ටත් සිදු විය. මිෂනාරි අධ්‍යාපනය නගා සිටුවන්නට පාලකයෝ වෙහෙසෙද්දී බෞද්ධ අධ්‍යාපනය අඩාල විය. කතෝලික ආගම රට පුරා ප්‍රචාරය වුවද බුදුදහම තරම් ජන හදවත් වෙත සමීප වූ හෝ කාවැදුණු බවක් දක්නට නො ලැබිණි. කොතරම් තාඩන පීඩන මැද්දේ වුවද බෞද්ධ භික්ෂූන් වහන්සේලා බුදුසසුන රැකගැනීමේ සටන අත් නො හැර ක්‍රියා කළහ.

වරෙක පෙත්සම් තුළින් ආගමික මතවාද හුවමාරු වූ අතර පසුව වාද විවාද රාශියක් ඒ වෙනුවෙන් ඇති විය. ලක්දිව පැවති ප්‍රකට වාද අතර පානදුරා වාදයට හිමිවූයේ සුවිශේෂී තැනකි. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ක්‍රිස්තියානි මතවාද ඛණ්ඩනය කළ එම වාදය එකල මෙරට පමණක් නොව විදේශයන්හි පවා ප්‍රචලිත විය. ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ එහි පිටපතක් කියැ වූ ඇමරිකන් ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ලංකාව පිළිබඳව මහත් පැහැදීමක් ඇති වී ලංකාවට පැමිණීමට තීරණය කෙළේය. ඒ අනුව රුසියන් ජාතික බ්ලැවුට්ස්කි මැතිණිය ද සමග ලංකාවට පැමිණි ඕල්කට්තුමා බුද්ධාගම ද බුද්ධ ශාසනය ද රැක ගැනීමෙහි ලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කෙළේය. බුදු දහම චිරාත් කාලයක් පැවති අයුරින් ඉදිරියට පවත්වා ගෙන යාමට නම් එය දරුවන් වෙත කා වැද්දවීමේ අවශ්‍යතාව තේරුම් ගත් ඕල්කට්තුමා බුදුදහම හා බුදු සසුන රැක ගැනීමට පෙළ ගැසුණු පිරිස්හි දායකත්වය ද ලබාගනිමින් ඉරු දින බෞද්ධ දහම් පාසල් ක්‍රමය ඇරඹීය. ප්‍රථම ඉරු දින දහම් පාසල ගාල්ල විජයානන්ද විහාරස්ථානයේදී අගෝස්තු 03 වනදා ආරම්භ කළ අතර එය වර්තමානයේ ද සක්‍රීය ව පවතී.


එලෙස ඇරඹි දහම් පාසල් අධ්‍යාපන ක්‍රමය ලංකාව පුරාම ව්‍යාප්ත වූ අතර ඉන් දහම් අධ්‍යාපනය දරුවන් වෙත ලබා දීම පමණක් ඉලක්ක වූයේ නැත. පුද්ගල චර්යා සංවර්ධනය ළමා මනස ඉලක්ක කොට සිදු වීමක් මෙහිදී දක්නට ලැබේ. චරිත සංවර්ධනය වන්නේ සාරධර්ම උකහා ගැනීමෙනි. සාරධර්ම යනු ''සමාජ ධර්මතාවන්හි සාරවත් නැතහොත් හරවත් කොටස'' යැයි තේරුම් කළ හැකිය. හරවත් දේ තුළින් යහපත් ආකල්ප ගොඩ නගා ගන්නා දරුවා තුළ සදාචාරවත් චර්යාවක් ගොඩ නැගේ. 'යහපත-අයහපත', 'හොඳ-නරක', 'යුතු-අයුතු', 'කුසල-අකුසල' යන දෙයාකාර ගමන් මග හඳුන්වා දීමටත් ඒ මගින් අයහපතින් වළකා පිරිපුන් පුද්ගලයෙකු බිහි කිරීමටත් ආගමකට කළ හැකි මෙහෙය අතිමහත් ය. බුදු දහමට ඒ වෙනුවෙන් කළ හැකි පුළුල් කාර්යය ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය තුළින් ඉටු විය. දහම් පාසල සාරධර්ම පෝෂණය ලබා දෙන තෝතැන්නක් විය යුතුය.

නූතන දහම් පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සාරධර්ම දරුවන් වෙත ප්‍රේෂණය කිරීමේ කාර්යය ක්‍රමවත් ව ඉටු වන්නේ දැයි විමසා බැලීමෙන් ශ්‍රී ලාංකික ජන සමාජයෙහි සාරධර්ම පෝෂණය විෂයයෙහි දහම් පාසල් අධ්‍යාපනයෙන් වන බලපෑම අවබෝධ කර ගත හැකිය. එබැවින් දහම් පාසල්වල නූතන ක්‍රියාකාරීත්වයත් උද්ගත ව ඇති ගැටලුත්, සමාජමය වටපිටාවෙහි ස්වභාවයත්, රජයේ මැදිහත්වීමත්, දහම් පාසල් යෑමෙන් ප්‍රයෝජනයක් වේද යන්නත්, පිළිබඳව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරන ලදී. මේ සියලු කරුණු ලංකාව පුරා ආවරණය වන පරිදි පර්යේෂණයක් කිරීම අපහසු බැවින් ''නූතන ශ්‍රී ලාංකික ජන සමාජයෙහි සාරධර්ම පෝෂණය විෂයයෙහි දහම් පාසල් අධ්‍යාපනයෙහි බලපෑම'' නම් වූ මාතෘකාව යටතේ ක්ෂේත්‍රය ලෙස තෝරා ගන්නා ලද්දේ බුත්තල ශාසනාරක්ෂක බල මණ්ඩල ප්‍රදේශය පමණි.

බුත්තල යනු මොණරාගල දිස්ත්‍රික්කයට අයත් මොණරාගල සිට සැතපුම් 11 ක් පමණ දුරින් පිහිටි ප්‍රදේශයකි. බුත්තල කේන්ද්‍රස්ථානය ලෙස ගත් කල නැගෙනහිරින් මොණරාගල ද, දකුණින් කතරගම ද, බටහිරින් වැල්ලවාය ද, උතුරින් බඩල්කුඹුර ද යන නගර හා ප්‍රදේශ පිහිටා ඇත. ඈත අතීතයේ සිට ම බුද්ධාගම පිළිබඳ වැදගත් සංසිද්ධීන් හි නටබුන් රාශියක් බුත්තල ප්‍රදේශය අවටින් හමු වී තිබේ. අරියාකර විහාරය (මාළිගාවිල), දෙමටමල් විහාරය, යුදඟනා රජ

මහා විහාරය, කටුගහගල්ලේ පුරාණ රජ මහා විහාරය වැනි ස්ථාන රාශියක් බෞද්ධාගමික වශයෙන් ද ඓතිහාසික වශයෙන් ද වැදගත් වේ.

**බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ මායිම්**



දහම් පාසල් අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් තුළ ම ක්‍රියාත්මක වුව ද පර්යේෂණයට තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ දහම් පාසල් 29 ක් ක්‍රියාත්මක වේ. ඒවා මෙසේයි:-

1. ශ්‍රී ගැමුණු දහම් පාසල - දෙමටමල් රජමහා විහාරය- ඔක්කම්පිටිය
2. ශ්‍රී සුමංගල දහම් පාසල - උණාවටුන රජමහා විහාරය- බුත්තල
3. ශ්‍රී ධර්මෝදය දහම් පාසල - යුදඟනාව රජමහා විහාරය-බුත්තල
4. සිරි සුමනජෝති දහම් පාසල - මාලිගාවිල රජමහා විහාරය- මාලිගාවිල- බුත්තල
5. ශ්‍රී රතනජෝති දහම්පාසල - ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය- ඔක්කම්පිටිය
6. ශ්‍රී පඤ්ඤානන්ද දහම් පාසල- ගලේ විහාරය-බුරුතගොල්ල- ඔක්කම්පිටිය
7. ශ්‍රී ගුණරතන දහම් පාසල- දොළපීල්ල රජමහා විහාරය-උඩගම-බුත්තල

8. ශ්‍රී මලියදේව දහම් පාසල- ශ්‍රී විජයාරාමය-මැදගම-බුත්තල

9. ශ්‍රී පේමානන්ද දහම් පාසල-තිබ්බටුවාව පුරාණ විහාරය- අළුත්වෙල-බුත්තල

10. ශ්‍රී සිද්ධාර්ථ දහම් පාසල-පෝයමළු පුරාණ විහාරය-වගුරුවෙල

11. ශ්‍රී මිහිඳු දහම් පාසල-හප්පෝරුව පුරාණ විහාරය- මැදගම-බුත්තල

12. ශ්‍රී සරණංකර දහම් පාසල-මුල්ගිරිපුරාණ විහාරය-ඌව පැල්වත්ත

13. ශ්‍රී ඕවාගිරි දහම් පාසල-ඕවාගිරි පුරාණ විහාරය-ඌව පැල්වත්ත

14. ශ්‍රී සෝභිත දහම් පාසල- දේවගිරි පුරාණ විහාරය-හොරබොක්ක-ඌව පැල්වත්ත

15. ශ්‍රී පියතිස්ස දහම් පාසල - කුකුළුවා විහාරය-කුකුරම්පොල-ඌව පැල්වත්ත

16. ශ්‍රී දුටුගැමුණු දහම් පාසල-වලගම්බා පුරාණ විහාරය -19 කණුව- ගෝනගංආර-බුත්තල

17. ශ්‍රී දේවානන්ද දහම් පාසල-බෞද්ධා ලෝක පිරිවෙණ- උණාවටුන-බුත්තල

18. ශ්‍රී සද්ධාතිස්ස දහම් පාසල-ශ්‍රී චන්ද්‍රමධුරාරාමය-(සීනිසමාගම)- පැල්වත්ත- බුත්තල

19. ශ්‍රී සීලරතන දහම් පාසල- ශ්‍රී ගංගාරාමය-මැනුම්සේවා ජනපදය-(සීනිසමාගම)- බුත්තල

20. ශ්‍රී සම්බෝධි දහම් පාසල-ශ්‍රී සම්බෝධි ධර්මායතනය- 18 කණුව- ගෝනගංආර-බුත්තල

21. ශ්‍රී ඥානානන්ද දහම් පාසල- රහතන්කන්ද ආරණ්‍යය-වෙල්ලස්සේගම-බුත්තල

22. ශ්‍රී රාහුල දහම් පාසල- කුඩාඔය- බුත්තල

23. ශ්‍රී විමලානන්ද දහම් පාසල- බෝධිමළු ආරණ්‍යය- 21 කණුව-ගෝනගංආර-බුත්තල

24. ශ්‍රී ඥානෝදය දහම් පාසල- දේවගිරි ආරණ්‍යය-මහගොඩයාය

25. ශ්‍රී ශාසනෝදය දහම් පාසල-බෝධිමළු විහාරය-ජනාවාස 04-කුමාරගම-ඌව පැල්වත්ත

26. ශ්‍රී පියනන්ද දහම් පාසල-මහසෙන්ගම-ජනාවාස 10-(සීනි සමාගම)-පැල්වත්ත-බුත්තල

27. ශ්‍රී ධර්මාශෝක දහම් පාසල- ජනාවාස 10-(සීනි සමාගම)-පැල්වත්ත-බුත්තල

28. ශ්‍රී සීවලී දහම් පාසල-මහාසේන භික්ෂුණී ආරාමය-මහාසෙන්පුර-ඌව පැල්වත්ත

29. ශ්‍රී සුගත දහම් පාසල-ජනාවාස 04-ඌව පැල්වත්ත

30. ශ්‍රී ධර්මවිජය දහම් පාසල-ශ්‍රී ගුණරතනාරාමය-කටුගහගල්ගේ ජනපදය-බුත්තල

(ලියාපදිංචි කර ඇතත්, මෙය අක්‍රිය දහම් පාසලකි)

අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා මෙම ප්‍රදේශය තෝරා ගැනීම සුදුසු යැයි උපකල්පනය කෙළේ මෙම ප්‍රදේශය සදාචාර සම්පන්න හා සදාචාර විරෝධී යන දෙකොටස ම අයත්වන පිරිස් එක සේ වෙසෙන ප්‍රදේශයක් ලෙස සැලකෙන බැවිනි. ප්‍රදේශයේ විහාරස්ථාන, ආරණ්‍ය සේනාසන, භාවනා මධ්‍යස්ථාන හා අසපු ඇසුරින් සුචරිතයට නැඹුරු වන කොටස් පිළිබඳ තොරතුරු ද ප්‍රදේශයේ සිදු වන අපරාධ, නීති විරෝධී හා සමාජ විරෝධී ක්‍රියා පිළිබඳ සංඛ්‍යා ලේඛණ අනුව ඊට මුල් වන සමාජ කොටස් පිළිබඳ තොරතුරු ද තුලනාත්මක ව විමසා බැලීමට බලාපොරොත්තු වෙමි.

## අධ්‍යයනයේ අරමුණු

''නූතන ශ්‍රී ලාංකික ජන සමාජයෙහි සාරධර්ම පෝෂණය විෂයයෙහි දහම් පාසල් අධ්‍යාපනයේ බලපෑම'' නම් වූ මෙම නිබන්ධයෙහි පහත සඳහන් අරමුණු සාධනය කර ගැනීමට අපේක්ෂිත ය.


## ප්‍රධාන අරමුණු

මෙම පර්යේෂණ නිබන්ධයේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ජීවත් වන පුද්ගලයින්ගේ සදාචාර පර්යාය ආරක්ෂා කර ගැනීමට දහම් පාසල් අධ්‍යාපනයෙන් වන සේවය කුමන ආකාරයෙන් බලපානවා ද යන්න අධ්‍යයනය කිරීම යි.

## සෙසු අරමුණු

- දහම් පාසල් අධ්‍යාපනය කෙරෙහි වර්තමාන සමාජයේ ඇති නැඹුරුව පරීක්ෂා කිරීම.
- දහම් පාසල් අධ්‍යාපනයේ ඇති වැදගත්කම විමසා බැලීම.
- දහම් පාසල් අධ්‍යාපනය සම්බන්ධ ගැටලු විමසා බැලීම.
- පුද්ගල චර්යා රටාව කෙරෙහි දහම් පාසල් අධ්‍යාපනයේ දායකත්වය හඳුනා ගැනීම.
- දහම් පාසල් අධ්‍යාපනය කෙරෙහි රජයේ දායකත්වය එහි ඉදිරිගමන උදෙසා බලපාන්නේ ද යන්න පිරික්සීම.
- ගිහි පැවිදි සමාජයේ දහම් අධ්‍යාපනය විෂයයෙහි පිදෙන දායකත්වය විමසා බැලීම.

## ක්‍රමවේදය හා මූලාශ්‍ර පරිචය




ප්‍රාථමික මට්ටමින් දත්ත ලබා ගැනීමේදී ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් සාකච්ඡා, නිරීක්ෂණ යන ක්‍රම උපයෝගී කර ගන්නා ලදී.

ද්විතීයික දත්ත යටතේ ආයතන මට්ටමින් තොරතුරු ලබා ගෙන ඇත. පාසල, පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පන්සල, පොලිස් අධිකාරී කාර්යාලය යන ආයතන වෙතින් තොරතුරු ලබා ගත්තෙමි. එමෙන් ම මූලාශ්‍ර මගින් තොරතුරු ලබා ගැනීමේ දී ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික යන තෙවැදෑරුම් මූලාශ්‍ර මගින් තොරතුරු රැස් කෙරිණි.

1. ප්‍රාථමික මූලාශ්‍ර :- නිකාය ග්‍රන්ථ
2. ද්විතීයික මූලාශ්‍ර :- විචාරාත්මක ග්‍රන්ථ
   සංස්කරණ ග්‍රන්ථ
   විශ්ව කෝෂ
   ශබ්ද කෝෂ
3. තෘතීයික මූලාශ්‍ර :- වාර්තා
   ලිපි ලේඛන
   වාර සඟරා
   පුවත්පත් ප්‍රකාශන